ඔවුන් එයට ඇතුළු වූයේ නම්, විනිශ්චය දිනය දක්වා ඔවුන් කිසි විටෙකත් එයින් පිටතට නොඑනු ඇත. කීකරුකම ඇත්තේ යහපත් කටයුතුවල පමණි

අලී (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී: නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ කණ්ඩායමක් යවා අන්සාර් වරුන්ගෙන් කෙනෙකු ඔවුන්ගේ නායකයා ලෙස පත් කර, ඔවුන්ට කීකරු වන මෙන් උපදෙස් දුන්හ. වරක් ඔහු කෝපයට පත් ව මෙසේ පැවසීය: "මට කීකරු වන ලෙස නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ඔබට අණ කළේ නැද්ද?" ඔවුන් 'එසේය' යැයි පැවසූහ. එවිට ඔහු: "එසේ නම්, මට දර එකතු කර දෙන්න." ඒ අනුව ඔවුන් ඒවා එකතු කළහ. ඉන්පසු ඔහු ගින්නක් දල්වන්නැයි පැවසීය. එවිට ඔවුන් එසේ ද කළහ. ඉන්පසු ඔහු: 'එයට ඇතුළු වන්න' යැයි පැවසීය. ඔවුන් එසේ කිරීමට සූදානම්ව සිටිය ද, සමහරු අනෙක් අයව වළක්වා ගනිමින් මෙසේ පැවසූහ: 'අපි ගින්නෙන් බේරීමට නබි (සල්ලල්ලාහු අලයිහි
වසල්ලම්) තුමාණන් වෙත පලා ගියෙමු.' ගින්න නිවී ඔහුගේ කෝපය පහව යන තෙක් ඔවුන් එලෙසම සිටියහ. මේ බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ට දැනුම් දුන් විට,
එතුමාණෝ මෙසේ පැවසූහ.: "ඔවුන් එයට ඇතුළු වූයේ නම්, විනිශ්චය දිනය දක්වා ඔවුන්
කිසි විටෙකත් එයින් පිටතට නොඑනු ඇත. කීකරුකම ඇත්තේ යහපත් කටයුතුවල පමණි."
[صحيح] [متفق عليه]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ සේනාවක් යවා අන්සාර් වරුන්ගෙන් කෙනෙකු ඔවුන්ගේ නායකයා ලෙස පත් කර, ඔහුට කීකරු වන මෙන් ඔවුනට නියෝග කළහ. වරක් එම නායකයා ඔවුන් කෙරෙහි කෝපයට පත් වූ අවස්ථාවේ 'නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මට කීකරු වන මෙන් ඔබට අණ කළේ නැද්ද?' යැයි ඔහු ඔවුන්ගෙන් විමසා සිටියේය. ඔවුහු 'එසේය' යැයි පැවසූහ. පසුව ඔහු දර එකතු කර ඒවායෙහි ගිනි දල්වා එයට ඇතුළු වන මෙන් නියෝග කර සිටියේය. ඔවුන් එසේ එහි ප්රවේශ වීමට සිතුව ද ඔවුන් එකිනෙකා දෙස බලා ගත්හ. ඔවුහු මෙසේ පැවසූහ: "අපි ගින්නෙන් බේරීමට මිස නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ට අවනත වීමෙන් දුරස් නොවූයෙමු. අපි එහි පිවිසිය යුතු ද?" ඒ අතර ඇවිළෙන ගින්න නිවී නායකයාගේ කෝපය පහව ගියේය.'ං ඒ බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ට දැනුම් දුන් විට, එතුමාණෝ මෙසේ පැවසූහ.: "ඔවුන් ඔහුට අවනත වී, ඇවිළුණු එම ගින්නට ඇතුලු වූයේ නම්, එහි ඔවුන් වේදනාවට ලක්වන අතරම ලොව පවතින තුරා ඔවුන් ඉන් බැහැර වන්නේ ද නැත. මැවුම්කරුට පිටුපෑමෙහි මැවීම්වලට අවනත වීමක් නැත. එසේ අවනත විය යුත්තේ යහපත් කටයුතුවල දී මිස පාපකාරී කටයුතුවල දී නොවේ."

http://www.sunnah.global/hadeeth/si/show/66184